# 25 නවෝදයේ අරුණාලු

**සාමය හා සමෘද්ධිය පිළිබඳව බයිබලයේ ඉගැන්වීම් අධ්‍යයනය කරමින්, සාමකාමී ලොවක් ගොඩ නැගීමේ ප්‍රායෝගික බව අත් දකින්නට මග පෙන්වීමක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

## මීකා 4 පරිච්ඡේදය

### මීකා දිවැසිවරතුමාගේ සේවයේ පසුබිම

යෙසායා මෙන් ම මීකා ද දර්ශන මඟින් දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයට කැඳවන ලදී. හෙතෙම සාමාන්‍ය ජනතාව අතරේ වාසය කළ කෙනකු බව පෙනේ. මීකා දිවැසිවරයා යෙසායා දිවැසිවරයාගේ සමකාලීනයෙකි. එහෙත් හෙතෙම දිවැස් වැකි ප්‍රකාශ කළේ දකුණුදිග ජුදා රාජ්‍යයේ ය. සමාජ සාධාරණත්වය පිළිබඳව දැඩි ලෙස කරුණු ඉදිරිපත් කළ ඔහු ජුදා රාජ්‍යය පාලකයින් හෙළා දකියි. ඔවුන්ගේ අසාධාරණ, අදේවභක්තික ගති පැවතුම් හා පාලන ක්‍රම නිසා සියොන් (ජෙරුසලම) නටබුන් ගොඩක් බවට පත්වෙන බව ප්‍රකාශ කරයි.

මේ අදහස් ප්‍රකාශ කරන ඔහු, සාමය හා සාමකාමීත්වය පිළිබඳව උදාර අදහස් කිහිපයක් ඉදිරිපත් කරයි. අපි දැන් ඒවා විමසා බලමු.

### සමිඳාණන් උදා කරන සාම යුගය

මීකා 4: 1 පදයේ 'මතු දවස' යන වචනය යෙදීමෙන් දෙවියන් වහන්සේ කිසියම් සුවිශේෂී කාලයක සාමය පිහිටුවන බව පවසයි. එය සිදු වන්නේ සියොන් කන්ද, එනම් ජෙරුසලමේ ය. ඉන් පවසන්නේ සියලු වාද භේද, වෛර ක්‍රෝධ, අබිබවා සාමය රට තුළ මහ ඉහළින් ස්ථාපිත කරනු ලබන බව යි.

මීකා 4: 3 වන පදය තුළ දේව සෙනඟ තුළ ජනිත වන සාමකාමී ජීවිත රටාව මනාව පැහැදිලි වෙයි. එහි "තමන්ගේ කඩු වලින් නගුල් තල ද හෙල්ලවලින් දෑකැති ද තළාගනු ලබන" බව පවසයි. මෙමඟින් අවධාරණය කරන්නේ යුද මානසිකත්වය සම්පූර්ණයෙන් පහවීමේ ලකුණක් ඇති වී තිබෙන බවයි. එනම් සෙනඟ තම කෘෂි කාර්මික ජීවිත රටාවට මුල්තැන දී සාමකාමී දිවි පෙවෙතක් ගත කරන දවසක් උදාවන බව යි.

සාමය තහවුරු වන විට මිනිස් සිතෙන් බිය පහ වී යයි. (මීකා 4: 4 අ) සාමයේ ප්‍රතිඵලය සමෘද්ධිය යි. 'එකිනෙකා තම තමාගේ මිදි වැල යට ද, අත්තික්කා ගස යට ද යෙහෙන් වාසය කරනු ඇත' යනුවෙන් හෙතෙම පවසයි. (මීකා 4: 4 ආ) මිදිවැල හා අත්තික්කා ගස් ඇසුරෙන් මීකා පවසන්නට උත්සාහ දරන්නේ සමෘද්ධිමත්කමේ ස්වභාවය යි. මේ සමෘද්ධිය දෙවියන් වහන්සේ වෙතින් පහළ වන්නකි. විශේෂයෙන් මිදි වැල ජුදෙව් සෙනඟට ආර්ථික හා කෘෂිකාර්මික වශයෙන් පමණක් නොව, අධ්‍යාත්මික වශයෙනුත් ඉතා වැදගත් වන්නකි.

පුරාණ ගිවිසුමේ 'මිදි වතු' රූපකය බෙහෙවින් යොදාගෙන තිබේ.එහි මිදි වත්ත උපමා කර තිබෙන්නේ ඉශ්රායෙල් ජනතාවට ය. එමගින් දෙවියන් වහන්සේ දේව ජනතාවට දක්වන ප්‍රේමය ප්‍රකාශ වේ. මීකා දිවැසාවලියේ මිදි වතු භුක්ති විඳීම යන්නෙන් අදහස් කරන්නේ ආර්ථික සමෘද්ධිය පමණක් නොවේ. එමගින් දේව ප්‍රේමය තුළ සාමය භුක්ති විඳින, සාමකාමී ජීවන රටාවක ස්වභාවය අවධාරණය කෙරේ.

## සාමය, ෂාලොම් ලෙස

හෙබ්‍රෙව් භාෂාවෙන් 'ෂාලොම්' යන වචනය අනුව, සාමය පිහිටුවනු ලබන්නේ යුක්තිය හා සාධාරණත්වය සහිත සංදර්භයක ය. යුක්තිය හා ධර්මිෂ්ඨකම ස්ථාපිත නො කර සැබෑ සාමයක් බලාපොරොත්තු විය නො හැකි බව පුරාණ ගිවිසුමෙන් අපට පැහැදිලි වේ.

## සාමය ඇතිකරන්නෝ දේව දරුවෝ ය.

සාමය ඇතිකිරීම හෝ සාමකාමී දිවි පෙවෙතක් ගත කිරීම කිතුනු දිවියේ අනිවාර්යය චරිත ගුණාංගයකි. සාමය ලැබීම පමණක් නොව සාමකාමී වීමත්, සාමය පිහිටුවීම සඳහා දායක වීමත් කිතුනුවකුගෙන් බලාපොරොත්තු වේ. මෙය පෞද්ගලිකව පමණක් ලබන සාමයක් නොවේ. එමගින් මුළු සමාජයක්, දේශයක් තුළ සාමය ගොඩනැගීම පිණිස ක්‍රියාත්මක වීමක් අදහස් කෙරේ. මෙසේ කරන්නට දේව දරුකමේ උරුමය ලැබෙන බව නව ගිවිසුමේ මංගල වාක්‍ය තුළින් ද අපට දැන ගත හැකි වේ.

## සමගි වීමක් සඳහා මැදිහත් වීමේ අභියෝගය.

ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය අවසාන වී තිබුණත් සිත් සමගි වීමක් සිදු වී නොමැත. දෙවියන් වහන්සේ අප අතර සිත් සමගි වීමක් ඇති කිරීමට අපේක්ෂා කරන සේක. අප ඒ සඳහා ඉදිරිපත් වී කටයුතු කළ යුතු ය.

**සමගිවීමක් සඳහා මැදිහත්වීම** කිතුනු අපට වර්තමානයේ ඇති ඉතාම වැදගත් **අභියෝගය** යි. අපි බොහෝ විට අපේ ම පෞද්ගලික හා පවුලේ කටයුතු කිරීමට පමණක් සීමාවී සිටිමු. සමහර විට, ඉන් ඔබ්බට කටයුතු කළත්, අභියෝග ඇතිවන විට, ඒ කටයුතු අතහැර දැමීමට යොමු වන්නෙමු. මෙවැන්නක් වීම සුදුසු නැත. ගෙදර, පාසලේ, සමාජයේ හැකි සෑම අවස්ථාවක ම සාමය, සමගිය, ඇතිකිරීමේ දේව කාර්යයට හවුල් විය යුතු ය. දකුණු අප්‍රිකාවේ මයිකල් ලැප්ස්ලි පියතුමා මේ සඳහා කදිම උදාහරණයකි.



ගරු මයිකල් ලැප්ස්ලි පියතුමා

සුදු - කළු අන්තර් සම්බන්ධතා ශක්තිමත් කිරීම එතුමාගේ ප්‍රධාන සේවය යි. මෙහි නියැලීමේ දී එතුමා ට සිය අත්වල කොටසක් සම්පූර්ණයෙන්ම අහිමි විය. එහෙත් එතුමා දිරිමත් ව තවමත් ඒ කටයුත්තේ නියැලී සිටියි. අප රට තුළ මේ සම්බන්ධයෙන්, අතිගරු ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, සෝමසිරි කේ. පෙරේරා දේවගැතිතුමා වැනි අය මෑත කාලයේ කළ කාර්යභාරය අතිමහත් ය.

සාමයේ ජීවිතයකට ප්‍රබල සාක්ෂියක් වෙමින් දේව උපකාරයෙන් සමාජය තුළ ක්‍රියා කිරීමට ඔබ ද උත්සුක වීම වැගත් ය. එසේම සමගිය වෙනුවෙන් මැදිහත්කාරකමේ යෙදීමේ අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් දේව අභිප්‍රාය ඉටු කරමු.

**ක්‍රියාකාරකම්**

1. සාමය පිළිබඳ මීකා දිවැසිවරතුමා 4 වන පරිච්ඡේදයෙන් ප්‍රකාශ කරන අදහස් ලැයිස්තු ගත කරන්න.

2. ගරු මයිකල් ලැප්ස්ලි පියතුමාගේ සේවයේ වැදගත් කරුණු ගොනු කරන්න.